කොවිඩ්-19 ලෝක ව්‍යාප්ත වසංගතය සමගින් ලෝකයේ සෑම රටකම ජන ජීවිතය වෙනස් වී තිබේ. එනමුත්, කොවිඩ්-19 පාලනය කිරීම සඳහාත්, පොදුවේ කොවිඩ්-19 තත්වය සමගින් රෝගී වන හා ආශ්‍රිත සියලුදෙනාගේ ශුභසිද්ධිය උදෙසාත් අත්‍යාවශ්‍ය කාරණයක් වන්නේ, කොවිඩ්-19 ආසාදිතයන් සහ ආශ්‍රිතයන් පිළිබඳව සමාජය තුළ කොන් කිරීමේ ආකල්පයක් හෝ ගර්හාවක් ඇති නොවීමයි. ඒ සඳහා මාධ්‍ය මගින් ධනාත්මක අතට හෝ සෘණාත්මක අතට දක්වන දායකත්වයද නොසලකා හැරිය නොහැකි වේ.

උදාහරණ ලෙසින් දක්වන්නේ නම්, ලංකාදීප (11/23) සහ දිවයින (11/23) පුවත් වාර්තාවන්හි පළව තිබෙන "කොරෝනා සේවකයකු", "කොරෝනා කත" වැනි යෙදුම් දැක්විය හැක. මෙම යෙදුම් කෙතරම් ශිෂ්ට සම්පන්න වන්නේදැයි පැනයකි. එසේම ශිෂ්ට සම්පන්න නොවෙනා, කොන් කිරීමක් ඇති කරවන සුළු යෙදුම් මාධ්‍ය ඔස්සේ සමාජගත කිරීම ඔස්සේ සිදුවන්නේ, කොවිඩ්-19 ආසාදිතයන් සම්බන්ධයෙන් සමාජය තුළ වඩ වඩාත් කොන් කිරීමක් සහ ගර්හාවක් නිර්මාණය වීම නොවේද? එසේ නම් මෙය ආචාර ධර්ම විරෝධී මාධ්‍යකරණයක් නොවේද?

**#Covid19 #MediaEthicsSL #lka #SinhalaPress #Divaina #Lankadeepa**